පේරාදෙණිය විශ්වවිද්‍යාලය
UNIVERSITY OF PERADENIYA

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – 2016/2017 (April 2017)
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2016/2017 (අප්‍රේල් 2017)

**ලේඛන කුසලතා සහ සිංහල ශාස්ත්‍රීය ලේඛනය**
**Writing Skills and Academic Writing in Sinhala**
**SUPE (0I3)**

**කාලය පැය තුනයි (03).**

අභිමත ප්‍රශ්න **පහකට (05) පමණක්** පිළිතුරු සපයන්න.
මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව **අටකි (08).**
නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු කපනු ලැබේ.

---

1. සාරග්‍රහණය (Skimming) සහ පරිලෝකනය (Scanning) යන සංකල්ප පැහැදිලි කොට ශාස්ත්‍රීය අධ්‍යයනය සඳහා එමගින් ලැබෙන පිටිවහල පැහැදිලි කරන්න.

2. පෞද්ගලික කියවීමකදී සහ දේශනයකදී සටහන් ගැනීමේ (Note Taking) උපක්‍රම විස්තර කරන්න.

3. "ශාස්ත්‍රීය ලේඛනය (Academic Writing) විචාරාත්මක කියවීමක විචාරාත්මක ලේඛනයකි." පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

4. පරිච්ඡේද රචනයක (Paragraphing) අන්තර්ගතය පිළිබඳ සමාලෝචනයක් කරන්න.

5. විවිධ ලේඛන විලාස (Different Modes of Writing) විස්තර කොට, පෞද්ගලික රචනා විලාසයකට ආවේණික ගුණාංග පැහැදිලි කරන්න.

6. පර්යේෂණ නිබන්ධයක සැලැස්ම පිළිබඳ විමර්ශනයක යෙදෙන්න.

7. ශාස්ත්‍රීය ලේඛනයක සාර්ථකත්වය උදෙසා අක්ෂර වින්‍යාසය සහ විරාම ලක්ෂණවලින් ලැබෙන පිටිවහල පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

8. පහත දැක්වෙන කරුණුවලින් **තුනකට (03)** විස්තරාර්ථකථන සපයන්න.

   i අනුවාදාත්මක රචනය (Paraphrasing)
   ii පර්යේෂණ විධික්‍රම (Research Methodology)
   iii සාරාංශකරණය (Summarizing)
   iv නිබන්ධන පත්‍රිකා (Assignment Papers)
   v සංදිග්ධතාව (Ambiguity)

(සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 බැගිනි.)